පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

සතිය- 01

ශ්‍රේණිය - 09

සැකසුම - එල්.මහේෂ් විජේවර්ධන

**නිපුණතාවය** : පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.

**නිපුණතා මට්ටම** : මිනිස් හා සත්ව පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.

**ක්‍රියාකාරකම** : නාගරික පරිසරයක් චිත්‍රයට නගමු.

<u>පැවරුම</u>

1. අන්තර්ජාලය, රූපවාහිනිය වැනි ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයක් භාවිතා කරමින් නාගරික පරිසරයක වීඩියෝ පටයක් නරඹන්න.

2. එහිදී එම පරිසරයේ ඇති මිනිස් ක්‍රියාකාරකම්, සත්ව ක්‍රියාකාරකම්, පාරිසරික ස්වභාවය, ඇඳුම් පැළඳුම්, වර්ණ ආදිය පිළිබඳ සටහනක් තබා ගන්න.

3. වීඩියෝ පටය නැරඹීමේදී ඔබේ නෙත ගැටුණු සටහන් කර කරගත් සුවිශේෂී දෑ මතු වන පරිදි මිනිස් හා සත්ව රූප තනි තනිව දළ සටහන් අඳින්න.

4. ඔබ ඇඳගත් දළ සටහන් වල මුහුණුවල හැඟීම් ප්‍රකාශනය, ඇඳුම් පැළඳුම් වලින් නාගරික පරිසරයක ස්වභාවය මතු කිරීම ආදිය පිළිබඳ සුවිශේෂී අවධානය යොමු කරන්න.

5. ඉහත පියවරයන්හි දී ලබාගත් හුරුව ඔස්සේ නාගරික පරිසරයක ඔබ සිත් ගත් අවස්ථාවක් සුදුසු පරිදි මානව හා සත්ත්ව රූප යොදා ගනිමින් ප්‍රකාශන පූර්ණ දළ සටහනක් නිර්මාණය කරන්න.